වේවැල්, පිත්තල, මැටි, ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
பிரம்புகள், பித்தளை, மட்பாண்டங்கள், மரப்பொருட்கள் மற்றும் கிராமியக் கைத்தொழில் மேம்பாட்டு இராஜாங்க அமைச்சு
**State Ministry of Rattan, Brass, Pottery, Furniture and Rural Industrial Promotion**

මගේ අංකය / எனது இல: / My No. SMRIP/ES/10/විදාතා
ඔබේ අංකය / உமது இல: / Your No.
දිනය / திகதி / Date 2021.06.16

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන්
දිස්ත්‍රික් ලේකම්වරුන්
අමාත්‍යාංශ හා රාජ්‍ය අමාත්‍යාංශ යටතේ වන දෙපාර්තමේන්තු ප්‍රධානීන්
පළාත් දෙපාර්තමේන්තු ප්‍රධානීන්
ප්‍රාදේශීය ලේකම්වරුන්

**විදාතා සම්පත් මධ්‍යස්ථාන භාර නිලධාරී ලෙස අනුයුක්ත කිරීම.**

වේවැල්, පිත්තල, මැටි,ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය යටතේ සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල ආවරණය කරමින් විදාතා සම්පත් මධ්‍යස්ථාන හෝ ඒකක ස්ථාපිතව පවතී. ග්‍රාමීය කර්මාන්තකරුවන්ගේ ජීවන තත්වය ඉහළ නංවාලනු වස් ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා ඔවුන්ට අවශ්‍ය තාක්ෂණික දැනුම ලබාදීම විදාතා ඒකකවල නිලධාරීන්ගෙන් විශේෂයෙන් අපේක්ෂා කරනු ලැබේ. ඒ අනුව දැනට පුරප්පාඩුව පවතින විදාතා සම්පත් මධ්‍යස්ථාන සඳහා විද්‍යා උපාධිධාරීන් අනුයුක්ත කරගැනීමට මෙම අමාත්‍යාංශයේ අවධානය යොමුව පවතී.

02. එබැවින් ඔබ අමාත්‍යාංශයට / දෙපාර්තමේන්තුවට / ආයතනයට අනුයුක්තව දැනටමත් සේවයේ නියුතු විද්‍යාවේදී උපාධිධාරී සංවර්ධන නිලධාරීන් මෙම අමාත්‍යාංශයට ස්ථාන මාරු වීමට අපේක්ෂා කරන්නේ නම් ඔවුන් දැනුවත් කර, ඒ සඳහා අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

03. මේ සම්බන්ධයෙන් ඔබගේ සහයෝගය ඉතා අගය කොට සලකමි.

එම්.ඒ.බී.වී. බණ්ඩාරනායක,
ලේකම්,
වේවැල්, පිත්තල, මැටි, ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය.

පිටපත් :
1. දිස්ත්‍රික් විදාතා නිලධාරීන්
2. විද්‍යා හා තාක්ෂණ නිලධාරීන්

} මෙම අමත්‍යාංශයට අනුයුක්තවීමට අපේක්ෂා කරන විද්‍යා උපාධිධාරී සංවර්ධන නිලධාරීන් සිටී නම් ඔවුන් දැනුවත් කිරීම සඳහා


Level 07
West Tower
World Trade Centre
Echelon Square
Colombo 01

07 වන මහල
බටහිර කුළුණ
ලෝක වෙළඳ මධ්‍යස්ථානය
එචිලන් චතුරශ්‍රය
කොළඹ 01

Tel :+(94) 112 437 805
Tel :+(94) 112 437 828
Fax :+(94) 112 437 823